සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

තෙවන වාර පරීක්ෂණය - 2021

| 09 ශ්‍රේණිය | දෙවන බස සිංහල | කාලය පැය 02යි. |
|---|---|---|

නම/ විභාග අංකය :- ..............................................................................................

## I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **පහත පද සඳහා <u>ලිඛිත භාෂාවෙන්</u> යෙදෙන වචනය තෝරමු.**

(1) බලන්නෝන - (1) බලන්නේ ඕන (2) බලන් නෝන (3) බලන් ඕන (4) බලන්න ඕන

(2) කන්නෙපා - (1) කන් එපා (2) කන්න එපා (3) කන එපා (4) කන් නෙපා

(3) එන්නැද්ද - (1) එන් නැද්ද (2) එන්නෙ නැද්ද (3) එනවා නැද්ද (4) එන නැද්ද

- **<u>නිවැරදිව අකුරු යෙදී ඇති පදය</u> තෝරමු.**

(4) (1) අනුරාදපුරය (2) අනුරාද්ධපුරය (3) අනුරාධපුරය (4) අනුරාඨපුරය

(5) (1) පුස්තගාලය (2) පුස්තකාලය (3) පුස්ථකාලය (4) පුස්තහාලය

(6) (1) ප්‍රවේශ පත්‍ර (2) ප්රවේශ පත්‍ර (3) ප්‍රවේස පත්ර (4) ප්‍රවේෂ පත්‍ර

- **පහත මුලින් දැක්වෙන පදය සඳහා සුදුසු <u>සමානාර්ථ පදය</u> තෝරා ඉරක් අඳිමු.**

(7) යාළුවා - (1) සහෝදරයා (2) ධීවරයා (3) සතුරා (4) මිතුරා

(8) ගම - (1) ගම්මානය (2) රට (3) නගරය (4) පළාත

(9) ඔසුව - (1) ඕලු (2) බෙහෙත (3) ඔරුව (4) ඔළුව

- **පහත මුලින් දැක්වෙන පදය සඳහා සුදුසු <u>විරුද්ධාර්ථ පදය</u> තෝරා ඉරක් අඳිමු.**

(10) පිරිසිදු - (1) සුපිරිසිදු (2) අපිරිසිදු (3) අප්‍රසන්න (4) පවිත්‍ර

(11) හොඳ - (1) ගුණවත් (2) යහපත් (3) නරක (4) නැණවත්

(12) අලුත් - (1) නවීන (2) පරණ (3) නව (4) නැවුම්

- **පහත ඉරි ඇඳි පදය සඳහා ගැළපෙන <u>බහු වචනය </u>තෝරමු.**

(13) පුතා, අර අඬුමිටිය ගේන්න.

(1) අඬුමිට (2) අඬුමිටියෙන් (3) අඬු මිටි (4) අඬු මිටට

(14) අන්න බලන්න, ඈතින් **කන්ද** පේනවා.

(1) කන්දෙන් (2) කඳු (3) කඳුවල් (4) කන්දට

(15) බසය **පාසල** ළඟ නවතා තිබුණි.

(1) පාසල් (2) පාසලින් (3) පාසලට (4) පාසලෙන්

- **හිස්තැනට <u>සුදුසු වචනය </u>ලියමු.**

(16) පොඩ්ඩක් ඉස්සරහට ගිහින් හන්දියෙන් ............................................ හැරෙන්න.

(17) ගමේ මිනිස්සු ....................................... භාණ්ඩ හදනවා.

(18) ගම ගෙදරක් අසල කැලෑවක ................................... ජීවත් වෙයි.

(19) විදුහල්පතිතුමා ............................. සතිය ගැන කිව්වා නේද?

(20) මම මේ අඹ ඇටයක් ........................................ පුතේ.

(නරියෙක් / වමට/ රුක් රෝපණ / හිටවනවා / තල් ආශ්‍රිත)

(ලකුණු 2x20=40)

## II කොටස

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

**(01) පහත සඳහන් මාතෘකාවලින් <u>එකක්</u> තෝරාගෙන වචන <u>75ක</u> පමණ රචනයක් ලියන්න.**

(I) මා ගිය අධ්‍යාපන චාරිකාව

(II) වැඩිහිටියන්ට සලකමු

(III) මගේ ගෙවත්ත

(IV) කොරෝනා වසංගතයෙන් ආරක්ෂා වෙමු. (ලකුණු 20)

02) පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියමු.

ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි
අඹ, රඹුටන්, ජම්බු ඉදිලා
අද හැම තැන හරි හැඩයි

දොඹ ගස් යට මල් හැලිලා
සුවඳක් හැම තැන දැනෙයි
වලිකුකුළන් හඬලන කොට
අහං ඉන්න හරි හිතයි

ගස්වල දලු නැළවෙන කොට
ඇඟට හරිම සීතලයි
ඉගිලෙන අර සමනලයින්
අල්ලන්නට බැරි හැඩයි

(1) ගස් පිරී ඇත්තේ කුමන මල් වර්ගයෙන් ද?

(2) කවියේ සඳහන් පලතුරු වර්ග 02ක නම් ලියන්න.

(3) සුවඳක් දැනෙන්නේ කුමක් නිසාද?

(4) ඇඟට සීතලක් දැනෙන්නේ ඇයි?

(5) පහත දෙමළ වචනවලට ගැළපෙන සිංහල වචනය කවිපෙළෙන් සොයා ලියන්න.

(I) காட்டுக் கோழிகள்-..................... (II) அழகானது -.......................

(ලකුණු 2x5=10)

(03) පහත වාක්‍ය නිවැරදි අනුපිළිවෙලින් ලියමු.

(1) යන / එක / උයන්වත්තට / කොහේ ද? / බස්

..........................................................................................................................................

(2) අවහිර / මාර්ගය / කරුණාකර / නොකරන්න.

..........................................................................................................................................

(3) සෙනසුරාදා / අවට / හැමෝම / එන්න / උදේ

..........................................................................................................................................

(4) භූමියේ / විනීතව / පූජා / හැසිරෙමු.

..........................................................................................................................................

(5) ළඟ / කඩයක් / වාහනය / කෑම / නවත්වන්න

..........................................................................................................................................

(ලකුණු 2x5=10)

(04) හිස්තැනට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා ලියමු.
(ප්‍රධාන ශාලාවේ / විද්‍යාලයීය කලා සංගමය / මහා විද්‍යාලයේ / 2022.05.03 / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා)

**ආරාධනාවයි**

ලංකාගම (1) .........................................................

වාර්ෂික විවිධ ප්‍රසංගය

(2) ................................. වන දින

පෙ.ව. 10.00 ට විද්‍යාලයීය

(3) ............................................. උත්කර්ෂවත් ලෙස

පැවැත්වේ.

ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස

(4) .............................................................................................. සහභාගී වන අතර

ඔබ සැමට ගෞරවයෙන්

ආරාධනා කරමු.

මෙයට,

(5) ....................................

(ලකුණු 2x5=10)

(05) **පහත උදාහරණය බලා වාක්‍ය සම්පූර්ණ කරමු.**

උදා :- ළමයා සපත්තු ගලවනවා.

<u>ළමයා සපත්තු ගැලැව්වා.</u>

(1) අපි සමාධි බුදු පිළිමය බලනවා.

..........................................................................................

(2) තරඟකරුවන්ට තෑගි දෙනවා.

..........................................................................................

(3) ආච්චි වතුර ටිකක් බොනවා.

..........................................................................................

(4) පාසලේ බාලදක්ෂ කඳවුරක් පවත්වනවා.

..........................................................................................

(5) අපි උදෙන්ම පාසල් යනවා.

.......................................................................................... (ලකුණු 2x5=10)

(06) විනෝද චාරිකාවක් යෑම සඳහා පැමිණෙන ලෙස දන්වා ඔබේ මිතුරාට හෝ මිතුරියට ලිපියක් ලියන්න.

(ලකුණු 10)

(07) පහත දැක්වෙන පින්තූරය බලා අර්ථවත් වාක්‍ය 05ක් ලියමු.



1. ..........................................................................................

2. ..........................................................................................

3. ..........................................................................................

4. ..........................................................................................

5. ..........................................................................................

(ලකුණු 2x5=10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE

තෙවන වාර පරීක්ෂණය - 2021

09 ශ්‍රේණිය

# දෙවන බස සිංහල

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) 4 | (6) 1 | (11) 3 | (16) වමට |
| (2) 2 | (7) 4 | (12) 2 | (17) තල් ආශ්‍රිත |
| (3) 2 | (8) 1 | (13) 3 | (18) නරියෙක් |
| (4) 3 | (9) 2 | (14) 2 | (19) රුක් රෝපණ |
| (5) 2 | (10) 2 | (15) 1 | (20) හිටවනවා |

ලකුණු(2x20=40)

## II කොටස

(01) මාතෘකාවට අදාළව, නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව, වචන ගළපා, ඡේද වෙන් කර කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 20)

(02) (1) ඇහැළ මලින්
(2) අඹ, රඹුටන්, ජම්බු යන පලතුරුවලින් 02ක් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(3) දොඹ ගස් යට මල් හැලීම නිසා
(4) ගස්වල දලු නැළවෙන නිසා
(5) (I) වලිකුකුළන් (II) ලස්සනයි ලකුණු (2 x 5=10)

(03) (1) උයන්වත්තට යන බස් එක කොහේද?
(2) කරුණාකර මාර්ගය අවහිර නොකරන්න.
(3) සෙනසුරාදා උදේ අටට හැමෝම එන්න.
(4) පූජා භූමියේ විනීතව හැසිරෙමු.
(5) කෑම කඩයක් ළඟ වාහනය නවත්වන්න. ලකුණු (2 x 5=10)

(04) (1) මහා විද්‍යාලයේ (2) 2022.05.03
(3) ප්‍රධාන ශාලාවේ (4) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා
(5) විද්‍යාලයීය කලා සංගමය ලකුණු (2 x 5=10)

(05) (1) බැලුවා (2) දුන්නා
(3) බිව්වා (4) පැවැත්වූවා
(5) ගියා
ලකුණු (2 x 5=10)

(06) පෞද්ගලික ලිපියක ආකෘතියට අනුව, ලියුම ලියා ඇත්නම් සමස්ත ලකුණු ලබාදෙන්න. (ලකුණු 10)

(07) පින්තූරය බලා අර්ථවත් වාක්‍ය 05ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
ලකුණු (2 x 5=10)